## අපේ කෙතට අපේම බීජ වී

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ තමන්ට අවශ්‍ය බීජ වී තමන් විසින්ම නිපදවා ගැනීමට; ගොවිමහතුන් උනන්දු කරවීමට,

- ගුණාත්මක බව තහවුරු කළ කි.ග්‍රෑ. 1 ක බීජ වී පැකට්ටුවක් සහ
- තවාන් තැටි (පැරෂුට් තැටි) 25 ක් ලබාදීමට සැලසුම් කර ඇත.

ලබාදෙන තවාන් තැටි යොදා ගනිමින් පැරෂුට් ක්‍රමයට බීජ වී නිෂ්පාදනය කිරීම මඟින් වී කිලෝ එකකින් වී බුසල් 05ක් පහසුවෙන් නිපදවා ගත හැක. එම බීජ වී ප්‍රමාණය ඊළඟ කන්නයේ අක්කර 2 1/2ක් වූ භූමියක වගා කිරීමට ප්‍රමාණවත්ය.

## තමන් විසින්ම බිත්තර වී නිපදවා ගැනීමෙන්,

- එක් කන්නයකදී අක්කරයක් සඳහා අවශ්‍ය වන බිත්තර වී සඳහා වැය වෙන රු.3000 ක් පමණ වන මුදල මුළුමනින්ම ඉතිරි කර ගත හැක.
- ඉතා අඩු වියදමකින් ගුණාත්මක බවින් ඉහළ බීජ වී භාවිතා කිරීමට අවකාශ ලැබීම.
- මෙලෙස නිපදවා ගත් බිත්තර වී වලින් තවත් කන්න 03 ක් සඳහා ගුණාත්මක බිත්තර වී නිපදවාගත හැකිවීම.
- තමන්ට අවශ්‍ය ප්‍රමාණයට වඩා බිත්තර වී නිෂ්පාදනය කර ඇත්නම් අනෙකුත් ගොවිමහතුන්ට අලෙවි කිරීමට හැකිවේ.

## ගුණාත්මක බවින් ඉහළ බීජ,

- කලවම් නැත.
- හොඳින් පැළවේ. (අවම වශයෙන් ප්‍රරෝහණ ප්‍රතිශතය 85% කි)
- පෙනුම පැහැපත්ය.
- වල් ඇට හෝ වල් වී බීජ වලින් තොරය.
- කෘමි හා රෝග හානි වලට ඔරොත්තු දෙයි.
- ඒකාකාරී වර්ධනයෙන් යුත්, සරු පැළපතක් ලබා දීම.



## ගුණාත්මක බවින් ඉහළ බීජ වී වගාවට යොදා ගැනීමෙන් ලැබෙන වාසි

- අස්වැන්න 10% කින් වැඩි වනු ඇත.
- වල් පැළ පාලනයට පහසු වේ.
- පළිබෝධ හානිවලට ගොදුරුවීමට ඇති ඉඩකඩ අඩුය.
- වගා පාලන කටයුතුවලට පහසුවීම.
- ඉහළ වෙළඳ වටිනාකමකින් යුක්ත සහල් නිෂ්පාදනයට හැකි වීම.
- නිෂ්පාදන වියදම අඩු වීම.

## බීජ වී නිපදවා ගන්නා ආකාරය

- වී ටික හොඳින් පොලන්න/පිරිසිදු වතුරෙන් කීප විටක් සෝදන්න.
- පැය 36 ක් පොඟවා දින 2 ක් යහන් කරන්න.
- වතුර පහසුවෙන් සපයාගත හැකි, ජල ගැලීම් වලට ගොදුරු නොවන තැනක පැරෂුට් තවාන සඳහා අඟල් 5-6 උසට තවාන් පාත්ති සාදා ගන්න.
- ඒ මත පැරෂුට් තැටි අතුරන්න.
- සියුම් මඩ යොදා ගනිමින් තැටියේ සිදුරු එකිනෙක සමඟ සම්බන්ධ නොවන පරිදි පුරවන්න.
- දින දෙකක් යහන් කළ, යන්ත්‍රමින් පැළවූ බීජ, තැටියේ සිදුරකට ඇට 2-3ක් වැටෙන ලෙස යොදන්න.
- වී ඇට යාන්ත්‍රමින් මඩට යට කරන්න.
- බීජ යොදා අවසාන වූ පසු තවාන පොල් අතු හෝ මානා වැනි ද්‍රව්‍යයකින් වසුන් කරන්න. වසුන සඳහා පිදුරු යෙදුවහොත් වෙනත් ප්‍රභේද වල බීජ මිශ්‍ර වියහැකිය.
- තවාන වියළීමට නොදී අවශ්‍ය පරිදි වතුර යොදන්න.
- බීජ ප්‍රරෝහණය වන විට වසුන ඉවත් කරන්න.
- දින 12-14 අතරදී (පැළයක උස අඟල් 5 ක් පමණ) වගාව පිහිටුවන්න.
- පැළ විසි කිරීමේදී වර්ග මීටරයට පැළ 35-40 දක්වා පවත්වා ගැනීම ඉහළ අස්වැන්නකට හේතු වේ.
- නිවැරදිව ජල කළමනාකරණය තුළින් වල් පාලනය සිදුකරන්න.
- වල් මතුවුවහොත් අතින් ගලවා ඉවත් කරන්න.
- කරලෙන් 85% ක් මේරූ පසු අස්වනු නෙලා අනෙක් ප්‍රභේද සමඟ කලවම් නොවන පරිදි අස්වනු සකස් කරන්න.
- සකස් කරගත් වී පිරිසිදුකර හොඳින් අව්වේ වේලා මඳ පවනේ නිවෙන්නට තබා පිරිසිදු මළුවල අසුරා වාතාශ්‍රය ඇති සිසිල් වියළි ස්ථානයක ලී කොට කිහිපයක් තබා ඒ මත අසුරන්න.

Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya. Printed by: AGRICULTURE PRESS

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන - 2016 - 2018

# බිත්තර වී නිෂ්පාදන ව්‍යාපෘතිය







ඊළඟ කන්නයට අවශ්‍ය බීජ වී අපිම නිපදවා ගනිමු...

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම අමාත්‍යාංශය

FOOD FIRST